කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2012
2015 මාර්තු/අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය
**සිංහල - SINH E 2015**

සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමා

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව: 10 යි. කාලය : පැය 03 යි.

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1 කොටස

01. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා කතුවරයාගේ අවස්ථා නිරූපණ කුසලතාව අගයන්න

ජාලිය කුමාරයෝ කියන්නාහු පියාණන් වහන්ස, මා මෙ තෙක් දෑ කියතුත් නොබණන දෑය. නුඹ වහන්සේගේ ළය ගල කෙළේ ද? ය පත්තෙන් වැසුයේ ද? මේ කුමන දූඩි කමෙක් දෝ හෝ! නුඹ වහන්සේ මියෙන් නො බැණැ හිඳිනට කුමන වරදක් කෙළෙම් ද? .......... අප පිටින් වැගිරෙන ලෙහෙ බලන්නේ. අතැ බැඳි හළු බලන්නේ. මියෙන් නො බැණැ හිඳින්නේ මෙ යකු අප කා මරා පියන තුරු ද? අමඬිනට, අප වැඳැ සමු ගත් බව කියන්නැ. අප සුව පත් බව ද නැවැතැ දූක්මක් නොවන බව ද කියන්නැයි මෙ සේ හඬමින් යෙමින් සිටි සඳ බෝධි සත්ත්වයෝ .......... ළ කකියවා, 'අනේ, බමුණකු ළ දූඩි නියා යැ. මා ඇස් හමුයෙහි මෙ සේ දූඩි වැ මරන්නේ ඔබ්බෙහි කුමක් නම් නො කෙරේ ද? එන කලැ අප දෙ දෙනා හා ආ දරුවෝ, දූන් කටු බොරලුයේ කෙසේ නම් යෙත් දෝ හෝ. සයින් විඩා වූ දරුවන් කවුරු නහවා කිරි පොවත් දෝ හෝ. මැණියන් තන මැද සැනැසුණු දරුවෝ, අද රෑ කො තැනෙකැ හෙවැ නිඳත් දෝ හෝ. දරු සනායෙන් මා පා පිටැ හී හඬා පෙරළෙන බිසවුන් කෙසේ නම් කියා අස්වසම් දෝ හෝ යි මෙ සේ මහත් වූ ශෝකයෙන් සිතන්නාහු ..............වැඩැ හුන් හ.

02. අනුරාධපුර යුගයේ ගද්‍ය සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක් කරන්න.

03. ''බුත්සරණ, විද්‍යාචක්‍රවර්තීන් භක්ති සාහිත්‍යයට තිළිණ කළ අගනා උපහාරයකි.'' පැහැදිලි කරන්න.

නැතහොත්

සද්ධර්මරත්නාවලී බස් වහරේ දිස්වන සුබනම්‍යතාව සනිදර්ශන ව පහදන්න.

11 කොටස

04. ''බැද්දේගම නවකථාව වූකලී සත්‍යය හා කල්පිතය අතර මනා සංකලනයකි'' සාකච්ඡා කරන්න.

05. විලාසිනියකගේ ප්‍රේමය නවකථාවෙන් හෙළිවන එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ප්‍රතිනිර්මාණ ශක්‍යතාව කෙබඳු වූවක් ද යි පැහැදිලි කරන්න.

06. මඳුරසිංහ ගුණතිලකගේ කෙටිකතා කලාවේ විශේෂ ලක්ෂණ අවධාරණය කරමින් පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරාත්මක අගැයීමක් කරන්න.

1. රතු මැණික
11. මැක්කෝ
111. නිවුණු තේ කෝප්පය
1v. ප්‍රතිඵල ලේඛනය

111 කොටස

07. දේශීය(ගැමි) නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ ව පවත්නා විවිධ වූ මතවාද සමාලෝචනය කරන්න.

08. ජීවිතය පිළිබඳ ගැඹුරු දෘෂ්ටියක් හා ආධ්‍යාත්මික විවරණයක් සිංහබාහු නාටකයෙන් නිරූපණය වන අයුරු විමර්ශනය කරන්න.

09. ග්‍රීක ශෝකාන්ත නාට්‍ය අතර ඊස්කිලස්ගේ ප්‍රොමිතියස් බන්ධනයට හිමි වන්නේ කවර ස්ථානයක් ද යි පරීක්ෂා කරන්න.

10. ''අකිර කුරොසවගේ 'රෂෝමොන්' චිත්‍රපටය විශිෂ්ට රූප කාව්‍යයකි.'' විමසන්න.

නැතහොත්

'තුංමංහංදිය', සිංහල සිනමාවේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස විචාරක සම්භාවනාවට පාත්‍ර වූයේ කවර කරුණු නිසා ද යි පහදන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින්)